# රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ 59 වැනි වාර්ෂික මහා සභාව
(2023/2024)

## න්‍යාය පත්‍රය

**දිනය** : **2023 ජූනි** මස **24** වන දින

**වේලාව : පෙරවරු 10:00** ට

**ස්ථානය : සනෝරා උත්සව ශාලාව**, 668, පන්නිපිටිය පාර, තලවතුගොඩ

1. පන්සිල් ගැනීම
2. විද්‍යාලයීය ගීතය ගායනා කිරීම
3. පොල් තෙල් පහන දැල්වීම
4. මියගිය සාමාජිකයන් සිහි කිරීම
5. ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව
6. පසුගිය මහා සභා වාර්තාව ඉදිරිපත් කිරීම
7. වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම
8. වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම
9. මහා සභා රැස්වීම ප්‍රමාද වී පැවැත්වීම පිළිබඳ යෝජනා සම්මුතිය
10. ව්‍යවස්ථා සංශෝධනය
11. ලැබී ඇති නව යෝජනා
12. නිළධාරී මණ්ඩලයේ ඉවත්වීම සහ තාවකාලික සභාපතිවරයෙක් පත් කර ගැනීම
13. අභිනව නිළධාරී මණ්ඩලය තෝරා පත් කිරීම
14. අභිනව සභාපතිතුමාගේ කතාව
15. වෙනත් කරුණු
16. ස්තුති කතාව
17. වාර්ෂික මහා සභාවේ සමාප්තිය හා ජාතික ගීය ගායනා කිරීම
18. සුහද හමුව සහා දිවා භෝජන සංග්‍රහය

## යෝජනා සම්මුතිය

### රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ 59 වැනි වාර්ෂික මහා සභා රැස්වීම නොවැලැක්විය හේතුවෙන් ප්‍රමාදවී කැඳවීම අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවයි.

පෙර වසර කිහිපයක ගිණුම් වාර්තාවල වූ ප්‍රමාද දෝෂයන් කරණකොට ගෙන විගණන වාර්තා සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම හේතුවෙන්, පසුගිය මාර්තු 31 දින හෝ ඊට පෙර ව්‍යවස්ථානුකූලව පැවැත්විය යුතුව තිබූ 2023 වසර සඳහා වන 59 වැනි වාර්ෂික මහා සභා රැස්වීම ප්‍රමාද වී ඇත. එවන් අවස්ථාවක දී "සංගමයේ කටයුතු මෙහෙයවීම අනුශාසක හෝ උපඅනුශාසකවරුන්ට පැවැරෙන අතර එතැන් සිට ලිත් මාසයක් තුළ ව්‍යවස්ථානුකූලව වාර්ෂික මහා සභාව පැවැත්වීමට ඔවුන් විසින් පියවර ගත යුතුය" යනුවෙන් ව්‍යවස්ථාවේ 7.7 වගන්තියේ සඳහන් වේ.

එසේ වුවද ව්‍යවස්ථාවේ සඳහන් අයුරින් ක්‍රියා කිරීමට අනුශාසක හෝ උපඅනුශාසකවරුන් කටයුතු නොකිරීම හේතුවෙන් ද එවන් අවස්ථාවක දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව්‍යවස්ථාවේ ඌනතාවයක් ඇති බැවින් ද අවස්ථාවෝචිත පරිදි ව්‍යවස්ථාවේ 15 වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරමින් මහා සභාව කැඳවීම සඳහා ව්‍යවස්ථාවෙන් පනවා ඇති කොන්දේසිවලට යටත්ව 2023 වසරේ 59 වැනි වාර්ෂික මහා සභාව 2023ක් වූ ජූනි මස 24 දින පැවැත්වීමට සංගමයේ විධායක සභාව ඒකමතිකව තීරණය කරන ලදින් මෙම මහා සභාව නීත්‍යානුකූලව කැඳවන ලද බවට යෝජනා සම්මත කරන මෙන් ඉල්ලා සිටී.

රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ

59 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ දී ය

2023 ජූනි මස 24 දින

## 59 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ දී අනුමැතියට ඉදිරිපත් කිරීමට යෝජිත ව්‍යවස්ථා සංශෝධන

### 8. විධායක සභාව

### 8.1 ව්‍යවස්ථාමය වගන්තිය

"සංගමයේ කටයුතු මෙහෙයවීම සඳහා පහත සඳහන් විධායක සභාව සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමක දී තෝරා පත් කර ගත යුතු අතර, එම නිලධාරීන් ඊලග වාර්ෂික මහා සභා රැස්වීම තෙක් නිලතල දරනු ඇත."

**8.1 වගන්තියෙහි 15 වන අයිතමය මෙසේ සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.**

"15. විධායක සභිකයන් හතලිස් දෙනෙක්" යන්න "විධායක සභිකයන් පනස් දෙනකුට නොවැඩි" යනුවෙන් සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

**8.1.1 - අළුතින් හඳුන්වා දීමට යෝජිත ව්‍යවස්ථාමය වගන්තියකි.**

"පෙර වසරේ විධායක සභාවේ ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්කාරක (තොරතුරු සහ සන්නිවේදන ලේකම්) නිලතල දැරූ නිළධාරීන් නව වර්ෂය සඳහා පත් කර ගනු ලබන විධායක සභාවට අනිවාර්යයෙන්ම නිතරගයෙන් පත් විය යුතුය. තවද ඔවුනට නව සභාවෙහි විධායක නිලධාරී තනතුරු සඳහා වුවද පත්වීමට (සංගමයේ වයවස්ථාවලියට යටත්ව) බාධාවක් නොමැත."

### 8.3 ව්‍යවස්ථාමය වගන්තිය

"විධායක කමිටුවේ තනතුරු සහ කාරක සභික ධූර සඳහා නාම යෝජනා, මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත දිනට දින දහ හතරකට (14) පෙර, සංගමයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ. නාම යෝජනා පත්‍රයේ සාමාජික අංකය නම තනතුර භාර ගැනීමට තමා කැමති බවට අත්සන ද යෝජනාකරුගේ සහ ස්ථිරකරුගේ නම අත්සන් සහ සාමාජික අංක ද සඳහන් විය යුතුය."

**8.3 වගන්තිය මේ අයුරින් සංශෝධනයට යෝජනා වේ.**

"විධායක කමිටුවේ තනතුරු සහ කාරක සභික ධූර සඳහා නාම යෝජනා, මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත දිනට දින දහ හතරකට (14) පෙර ලැබෙන සේ සංගමයේ ලේකම්වරයා වෙත අතින්ම හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනයෙහි විශේෂයෙන් නියම කරනු ලබන වෙනත් ආකාරයකින් හෝ ලැබීමට සැලැස්විය යුතුය."[1]

[1] නාම යෝජනා භාර දීම නිශ්චිත කිරීම පිණිස කරන සංශෝධනයකි.

### 8.3.1 අළුතින් හඳුන්වා දීමට යෝජිත වගන්තියකි

"ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා පත්‍රයෙහි නාම යෝජිතයාගේ නම, සාමාජික අංකය, ලිපිනය, දුරකථන අංක, විද්‍යුත් තැපැල ආදී සියළු ඇමතුම් විස්තර ද යෝජිත තනතුර ද එකී යෝජිත තනතුර භාර ගැනීමට කැමති බවට යෝජිතයාගේ අත්සනින් යුතු ප්‍රකාශයක් ද යෝජනාකරුගේ සහ ස්ථිර කරන්නාගේ නම, සාමාජික අංකය සහ අත්සන් ද අඩංගු විය යුතු වේ. තවද එම නාම යෝජනා පත්‍රය, ව්‍යවස්ථාවෙහි දැක්වෙන "ආකෘති පත්‍ර අංක 1" "සමග සැලකිය යුතු ලෙස සාරානුකූල විය යුතුය.[2] (to be substantially in the 'Form I' as appended to the Constitution)."

## 8.6 ව්‍යවස්ථාමය වගන්තිය

### 8.6 පුරප්පාඩු

"ඉහත 8.1 යටතේ පත් කර ගත් තනතුරක පරප්පාඩු ඊළඟ මහා සභා රැස්වීමට පෙර ඇති වුවහොත් එම පුරප්පාඩුව සඳහා අදාල සුදුසුකම් සපුරන අයකු විධායක සභාවේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත හැකිය."

### 8.6 වගන්තිය මේ අයුරින් සංශෝධනයට යෝජනා වේ.

"ඉහත 8.1 යටතේ පත් කර ගත් තනතුරක පුරප්පාඩු ඊළඟ මහා සභා රැස්වීමට පෙර ඇති වුවහොත් එම පුරප්පාඩුව සඳහා අදාල සුදුසුකම් සපුරන අයකු විධායක සභාවේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත හැකිය. තවද වාර්ෂික මහා සභා රැස්වීමක දී පත් කර ගැනීමට නොහැකිව විධායක නිළධාරී හෝ විධායක සභික තනතුරු පුරප්පාඩු වුවහොත් එම තනතුරු සඳහා ද අදාල සුදුසුකම් සපුරන තැනැත්තන් විධායක සභාවේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත හැකිය."

## 9. මහා සභා රැස්වීම

## 9.1 ව්‍යවස්ථාමය වගන්තිය

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම් ලිත් වර්ෂයක් සම්පූර්ණ කිරීමෙන් ඊළඟ වර්ෂයේ මාර්තු 31 වන දින හෝ ඊට පෙර දිනයක පැවැත්විය යුතුය.

### 9.1 වගන්තිය මේ අයුරින් සංශෝධනයට යෝජනා වේ.

"සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම සෑම ලිත් වර්ෂයකම මාර්තු 31 වන දින හෝ ඊට පෙර දිනයක[3] පැවැත්විය යුතුය."

---

[2] නාම යෝජනා භාර දීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා කරන සංශෝධනයකි.
[3] භාෂාවේ අපැහැදිලි බව දුරු කිරීම සඳහා සිදු කරන සංශෝධනයකි.

## 7.7 ව්‍යවස්ථාමය වගන්තිය

"වාර්ෂික මහා සභා රැස්වීම වසරක කාළ සීමාව තුල පැවැත්වීමට නොහැකි වුවහොත් සංගමයේ කටයුතු මෙහෙයවීම අනුශාසක හෝ උපඅනුශාසකවරුන්ට පැවරෙන අතර එතැන් සිට ලිත් මාසයක් තුල ව්‍යවස්ථානුකූලව වාර්ෂික මහා සභාව පැවැත්වීමට ඔවුන් විසින් පියවර ගත යුතුය."

**7.7 වගන්තිය පහත ආකාරයට සංශෝධනය කර 9.1.1 වගන්තිය ලෙස නම් කිරීමට යෝජනා කෙරේ.**

"වාර්ෂික මහා සභා රැස්වීම නියමිත දිනට පෙර පැවැත්වීමට නොහැකි වුවහොත් සංගමයේ කටයුතු මෙහෙයවීම අනුශාසක සහ / හෝ උපඅනුශාසකවරුන්ට පැවරෙන අතර එතැන් සිට ලිත් මාසයක් තුල ව්‍යවස්ථානුකූලව වාර්ෂික මහා සභාව පැවැත්වීමට ඔවුන් විසින් පියවර ගත යුතුය."[4]

**11.15 ලෙස නව වගන්තියක් යෝජනා කෙරේ.**

"සංගමයේ සියලුම ගිණුම් ලේඛන හා වාර්තා (භාරකාර මණ්ඩලය, අනුබද්ධිත සංවිධාන සහ අනුකමිටු ගිණුම් ද ඇතුළුව) භාණ්ඩාගාරිකවරයාගේ භාරයේ සංගම් මූලස්ථාන කාර්යාලයෙහි හෝ එවන් ස්ථානයක් නොමැති විට ඔහු ප්‍රකාශයට පත් කරනු ලබන නිශ්චිත ස්ථානයක තිබිය යුතු අතර වාර අවසානයේ එකී සියලු ලේඛන අලුතින් පත්වන නව භාණ්ඩාගාරිකවරයාට නව වාරයේ මුල් කාරක සභා රැස්වීමට පෙර නොපමාව භාර කල යුතු වේ."

**14.2.1 ලෙස නව වගන්තියක් යෝජනා කෙරේ.**

"සංගමයේ ව්‍යවස්ථාව සහ කලින් කල ඊට සිදු කරනු ලබන සංශෝධන ඇතුලත් වාර්තා ද වාර්ෂික මහා සභා රැස්වීම්, විශේෂ සභා රැස්වීම සහ විධායක කමිටු රැස්වීම් වාර්තා ද සාමාජික ලියාපදිංචිය දැක්වෙන ලේඛනය ද කලින් කලට පත්වෙන සභාවන්හි නිලධාරී මණ්ඩලය ඇතුළු කාරක සභිකයන්ගේ නාම ලේඛන සහ පැමිණීමේ ලේඛන (රැස්වීම් සඳහා සහභාගීවීමේ) ද සංගමය විසින් නිකුත් කරනු ලබන නිවේදන සහ රාජකාරී ලිපි ලේඛන ඇතුළු සියළුම ලිපිගොනු ද සංගමයේ නිල මුද්‍රාවන් ද සංගමය සතු අනෙකුත් සියලු බඩුබාහිරාදිය ද ලැයිස්තුගත කොට සංගමයේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු වේ. එසේම එකී ලේඛන සහ බඩුබාහිරාදිය සංගමයේ ප්‍රධාන කාර්‍යාලයේ හෝ එවන් ස්ථානයක් නොමැති විට ලේකම්වරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන නිශ්චිත ස්ථානයක තැන්පත් කල යුතු අතර වාර අවසානයේ දී එම ලයිස්තුගත ලේඛන හා භාණ්ඩ අලුතින් පත්වන ලේකම්වරයාට නව වාරයේ මුල් කාරක සභා රැස්වීමට පෙර යථා පරිදි නොපමාව භාර දිය යුතුවේ."

---

[4] භාෂාවේ අපැහැදිලි බව දුරු කරමින් ක්‍රියාදාමය වඩා ප්‍රායෝගික කිරීම පිණිස වන සංශෝධනයකි.

**පහත සදහන් නව වගන්ති ව්‍යවස්ථාවට අතුලත් කිරීමට යෝජනා කෙරේ.**

**17. නිළ දැන්වීම්**

සංගමයේ ලේකම්වරයා විසින් වාර්ෂික මහා සභා / විශේෂ මහා රැස්වීම් සහ සංගමයේ අනෙකුත් නිළ නිවේදනයන් පහත කවර වූ ආකාරයකට හෝ ආකාර කිහිපයකට සිදු කළ හැකි අතර එසේ කරනු ලබන නිවේදනයක් යථා පරිදි සිදු කරන ලද නිළ නිවේදනයක් ලෙස සැළකිය යුතුවේ.

1. **සිංහල සහ / හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ජාතික පුවත්පතක(වල) පල කිරීමෙන්**
2. **එක් එක් සාමාජිකයාට ලියාපදිංචි තැපැල් මාර්ගයෙන්**
3. **සංගමයේ නිළ වෙබ් අඩවියෙහි පල කිරීමෙන්**

**17.1 සංගමයේ නිළ වෙබ් අඩවිය (Official Website)**

"සංගමයේ නිළ වෙබ් අඩවිය (Official Website) www.rahulaobacolombo.lk වේ. එය කිසියම් හේතුවක් මත අහෝසි වන්නේ / කරන්නේ නම් ඒ බව විධායක සභාවට දන්වා ඒ වෙනුවට වෙනත් වෙබ් අඩවියක් සකස් කර ගත යුතු වේ. තවද එලෙස සකස් කර ගන්නා නව වෙබ් අඩවිය විධායක සභාව විසින් සිය නිළ වෙබ් අඩවිය ලෙස පිළිගනිමින් සම්මත කළ යුතුවේ."

නීති ලේකම්

58 වැනි විධායක සභාව

__ව්‍යවස්ථාමය ආකෘති පත්‍ර 1__

__**රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ _____ වැනි විධායක සභා නාම යෝජනා පත්‍රය යි.**__

**20_ _ / 20 _ _ වර්ෂය**

**යෝජනා කරනු ලබන තනතුර :**

**යෝජිතයාගේ තොරතුරු**

සම්පූර්ණ නම :

සාමාජික අංකය :

ලිපිනය (ස්ථිර) :

දුරකථන (ජංගම / ගෘහ) :

විද්‍යුත් ලිපිනය :

වෘත්තිය :

ඉහත සඳහන් නාම යෝජනාව කරමි.

යෝජනාකරුගේ නම, සාමාජික අංකය සහ ලිපිනය------------------------------------------
------------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------

දිනය අත්සන

ඉහත නාම යෝජනාව ස්ථිර කරමි.

ස්ථිර කරන්නාගේ නම, සාමාජික අංකය සහ ලිපිනය-----------------------------------------
------------------------------------------------------------------------------------------------
---------------------------------------------------------------------------

දිනය අත්සන

ඉහත යෝජිත තනතුර සංගමයේ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලව භාර ගෙන කටයුතු කිරීමට එකඟ වෙමි. තවද ඒ සඳහා පූර්ව සුදුසුකම් මා සතුව නොමැති බවට හෙළිදරවු වුවහොත් මාගේ තනතුර එකෙනෙහිම අහෝසි වන බවට එකඟ වෙමි.

දිනය අත්සන